# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2085/12 - 2018 අගෝස්තු මස 21 වැනි අඟහරුවාදා - 2018.08.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි.

*මගේ අංකය* : එම්යූඑල්/එල්එන්ඩී/02/ඒසීකිව්/41.
*ඉඩම් අමාත්‍යංශයේ යොමු අංකය*: 4-3/15/2014/වීපී/282.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

**ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටදොල ග්‍රාම නිලධාරි වසමට අයත් පල්ලාවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 166, අතිරේක අංක 33, පත්‍රය 35 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි,

01. **කැබලි අංක 745**

ඉඩමේ නම : පුවක්ගහහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 5-10 ක් පමණ වයසැති රබර් ගස් 40ක්, අවුරුදු 20ක් පමණ වයසැති පොල් ගස් 1ක්, අවුරුදු 01-15 ක් පමණ වයසැති පුවක් ගස් 3 ක් , අවුරුදු 45-50 ක් පමණ වයසැති කොස් ගස් 4 ක් ඇත; හිමිකම් කියන අය: අංක 222, දෙනගම නැගෙනහිර, ගල්වැවේගෙදර පදිංචි ජී. ඒ. කරුණාරත්න; ප්‍රමාණය: හෙක්: 0.0300.

02. **කැබලි අංක 746**

ඉඩමේ නම : පැණිකොලහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 20-25 ක් පමණ වයසැති ඇට්ටෝනියා ගස් 2 ක්, අවුරුදු 30-35 ක් පමණ වයසැති ගොරකා ගස් 1ක්, අවුරුදු 35-45 ක් පමණ වයසැති පොල්ගස් 6 ක්, අවුරුදු 50-55 ක් පමණ වයසැති කොස් ගස් 4ක් ඇත; හිමිකම් කියන අය: අංක 218, කඩේගෙදර, දෙනගම නැගෙනහිර පදිංචි ජී. ඒ. ගුණපාල; ප්‍රමාණය: හෙක්: 0.0172.

03. **කැබලි අංක 747**

ඉඩමේ නම : පැණිකොලහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 15 ක් පමණ වයසැති පුවක් ගස් 1 ක්, අවුරුදු 30-35 ක් පමණ වයසැති ගොරකා ගස් 2 ක්, අවුරුදු 20-25 ක් පමණ වයසැති ඇට්ටෝනියා ගස් 2 ක් සහ අවුරුදු 25-30 ක් පමණ වයසැති කජු ගස් 1ක් ඇත; හිමිකම් කියන අය: ළිඳගාවදෙනිය, දෙනගම නැගෙනහිර, හක්මණ පදිංචි නැසීගිය ජී. ඒ. ගිමාරහාමි; ප්‍රමාණය: හෙක්: 0.0185.

04. **කැබලි අංක 748**

ඉඩමේ නම : පැණිකොලහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 35-40 ක් පමණ වයසැති පොල්ගස් 5ක්, අවුරුදු 40-45 ක් පමණ වයසැති ගොරකා ගස් 3ක්, අවුරුදු 10-12 ක් පමණ වයසැති පුවක් ගස් 2ක්, අවුරුදු 25-30 ක් පමණ වයසැති අඹගස් 1 ක්, අවුරුදු 20-30 ක් පමණ වයසැති වෙලන් ගස් 1 ක් සහ දෙල්ගස් 1 ක් ඇත; හිමිකම් කියන අය: 51සී, මාලිම්බඩගෙවත්ත, හිත්තැටිය, මාතර පදිංචි ජී.ඒ. ආරියපාල; ප්‍රමාණය: හෙක්: 0.0381.

1A - G28331 – 22 (2018/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. **කැබලි අංක 749**

ඉඩමේ නම : පැණිකොලහේන; ඉඩමේ විස්තරය : විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: බෝගහකොරටුව, දෙනගම බටහිර පදිංචි නැසීගිය එම්. ඒ. ජේමානිස්; ප්‍රමාණය: හෙක්: 0.0005.

06. **කැබලි අංක 750**

ඉඩමේ නම : පුවක්ගහහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 60-65 ක් පමණ වයසැති කොස් ගස් 1 ක්, අවුරුදු 30-35 ක් පමණ වයසැති පොල්ගස් 3 ක් , අවුරුදු 10-15 ක් පමණ වයසැති පුවක් ගස් 17 ක් ඇත; හිමිකම් කියන අය: වැලිපිටියෙගෙදර, දෙනගම නැගෙනහිර හක්මණ පදිංචි ජී. ඒ. දයාසේන සහ ඇල්ලවෙලගෙදර, දෙනගම බටහිර පදිංචි ජී. ඒ. පද්මලතා; ප්‍රමාණය: හෙක්: 0.0151.

07. **කැබලි අංක 751**

ඉඩමේ නම : පැණිකොලහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 50-55 ක් පමණ වයසැති පොල්ගස් 3 ක්, අවුරුදු 40-45 ක් පමණ වයසැති තේක්ක ගස් 2 ක්, අවුරුදු 10-15 ක් පමණ වයසැති පුවක් ගස් 5 ක්, අවුරුදු 20-25 ක් පමණ වයසැති ගොරකා ගස් 2 ක්, අවුරුදු 20 ක් පමණ වයසැති මාරගස් 1 ක් සහ අඹ ගස් 1 ක් ඇත; හිමිකම් කියන අය: බෝගහකොරටුව, දෙනගම බටහිර පදිංචි නැසීගිය එම්. ඒ. ජේමානිස්; ප්‍රමාණය: හෙක්: 0.0163.

08. **කැබලි අංක 752**

ඉඩමේ නම : පුවක්ගහහේන; ඉඩමේ විස්තරය : ගෙවත්ත, අවුරුදු 40 ක් පමණ වයසැති පොල්ගස් 1 ක්, අවුරුදු 20 ක් පමණ වයසැති දෙල් ගස් 1 ක්, සහ අවුරුදු 5-10 ක් පමණ වයසැති පුවක් ගස් 1 ක් ඇත; හිමිකම් කියන අය: අංක 235, පැණිකොලහේන, දෙනගම පදිංචි රණවීරගේ ජෝතිපාල; ප්‍රමාණය: හෙක්: 0.0033.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි බලය ලත් අයවලුන් හෝ 2018.10.31 වැනි දින ප.ව. 1.00 ට මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018.10.26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සුසන්ත අත්තනායක,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
මුලටියන.

2018 අගෝස්තු මස 16 වැනි දින,<br>
මුලටියන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

09-89

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.